# 2021

# ග්‍රාම සංවර්ධන සැලැස්ම

## හත්බෝධිය-538 B



**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-දෙහිවල**

# 538 B - හත්බෝධිය

## ග්‍රාම සංවර්ධන සැලැස්ම




ආර්ථික සංවර්ධන නිලධාරී

කල්පනා නවගමුව මිය

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1 | 1 වන කොටස - හැඳින්වීම | 02 |
| 1.1 | ග්‍රාම සංවර්ධන සැලැස්මේ පසුබිම | 02 |
| 1.2 | ග්‍රාම සංවර්ධන සැලැස්මේ අරමුණු | 02 |
| 1.3 | ග්‍රාම සංවර්ධන සැලැස්මේ මාර්ගෝපදේශ | 03 |
| 2 | 2 වන කොටස | |
| 2.1 | වසම හැඳින්වීම හා පිහිටීම | 04 |
| 2.2 | සිතියම සහ වසමේ මාරග ලේඛනය | 05 |
| 2.3 | සමාජීය සංස්කෘතික කරුණු | 06 |
| 2.4 | මූලික තොරතුරු | 06 |
| 2.5 | සංස්කෘතික හා සාමාජීය වශයෙන් වැදගත් ස්ථාන | 07 |
| 3 | යටිතල පහසුකම් සංවර්ධනය | 08 |
| 3.1 | මාර්ග පාලම් හා කාණු පද්ධතිය අළුත්වැඩියාව | 08 |
| 3.2 | භෞතික යටිතල පහසුකම් වලට ඇති සංවර්ධන යෝජනා | 09 |
| 3.3 | විශේෂ සංවරධන යෝජනා | 10 |
| 3.4 | අබලන් වී ඇති මාර්ග | 11 |
| 3.5 | නිවාස පහසුකම් සැලසීම | 12-13 |
| 3.6 | විදුලි පහසුකම් සැලසීම | 14 |
| 3.7 | සනීපාරක්ෂක පහසුකම් සැලසීම | 15 |
| 4 | නිපුණතා සංවර්ධන හා හැකියා වර්ධන සැලැස්ම | 16 |
| 5 | සමාජ සංවර්ධන සැලැස්ම | 17 |
| 5.1 | අධ්‍යාපනය | 18 |
| 5.2 | පාසල් | 18 |
| 5.3 | දහම් පාසල් අධ්‍යාපනය | 19 |
| 5.4 | පාසල් හා දහම් පාසල් වල සංවර්ධන අවශ්‍යතා | 19 |
| 5.5 | සෞඛ්‍ය | 20 |
| 5.6 | ආයුර්වේද සායන | 20 |
| 5.7 | ක්‍රීඩා හා ළමා උද්‍යාන ඉදිකිරීම | 21 |
| 6 | ළමා අපයෝජනය | 22 |
| 7 | මත්ද්‍රව්‍ය උවදුර | 23 |
| 8 | පරිසර කළමනාකරණය | 24 |
| 8.1 | කසළ කළමනාකරණය | 24 |
| 8.2 | ඩෙංගු මර්දනය | 25 |
| 8.3 | ආපදා කළමනාකරණය | 26 |
| 8.4 | වසමේ වැසි ජලයෙන් යටවෙන ස්ථාන | 27 |
| 9 | ග්‍රාම සංවර්ධන සැලැස්ම | 28 |
| 10 | ව්‍යාවූහාත්මක ක්‍රියා | 29 |
| 10.1 | ව්‍යාවූහාත්මක නොවන ක්‍රියා | 29 |

# 1. වන කොටස - හැඳින්වීම

## 1.1 ග්‍රාම සංවර්ධන සැලැස්මේ පසුබිම

වසමක අනාගතය උදෙසා සැලසුම් සකස් කිරීම ආරම්භ වන්නේ සමාජ, ආර්ථික, දේශපාලන හා පාරිසරික බලවේගයන්ගේ හැසිරීම්, ප්‍රවණතාවයන් පාදක කරගනිමිනි. එය එසේ වන්නේ නගරයක සංවර්ධනය හැඩ ගැසීම සිදුවන්නේ ඉහත බලවේගයන්ගෙන් අඩු හෝ වැඩි වශයෙන් වන බල පැවැත්වීම මත වන බැවින් හා ඒවා අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා කෙරෙහි විනාශකාරී හෝ ප්‍රගමනකාරී ලෙස නගර සංවර්ධනයට හේතු වීම මතය. මෙලෙස වසමක විකාශය, වෙනස් වීම අනිවාර්ය ක්‍රියාවලියක් වන නමුත් වසමක යහ පැවැත්ම සඳහා නිවැරදි ඉදිරි දර්ශනයක් සමඟ වසමේ පවතින විභවතාවයන් ප්‍රයෝජනයට ගනිමින් නව සංවර්ධන අවස්ථාවන් උදා කරදීම හා සංවර්ධන ප්‍රතිලාභ ජනතාවට ලබාදීම අරමුණු කොට ගනිමින් ග්‍රාම සංවර්ධන සැලැස්ම සකස් කිරීම සිදු කරයි.

## 1.2 ග්‍රාම සංවර්ධන සැලැස්මේ අරමුණ (VDP)

ග්‍රාම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ පරමාර්ථය වන්නේ ගමක සංවර්ධන ගැටළු හඳුනාගෙන ප්‍රමුඛතාවය දී ගම නැතහොත් වසම සංවර්ධනය කිරීමයි. සක්‍රිය ප්‍රජා සහභාගිත්වය සහ දේශීය සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා දිරිමත් කරන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

සංවර්ධන ගැටළු හඳුනා ගැනීමේදී කෙටිකාලීන මධ්‍යම හා දිගුකාලීන ලෙස ඉදිරි සංවර්ධන දර්ශනයකින් විසඳුම් සොයාගැනීම ග්‍රාම සංවර්ධන සැලසුම් මගින් විස්තරාත්මකව අධ්‍යනය කෙරේ. ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ ගමේ ප්‍රජාවගේ භෞතික, සමාජ, ආර්ථික ජීවනෝපාය හා සංස්කෘතික විශ්ලේෂණය මත සංවර්ධන ගැටළු හඳුනාගැනීමට ප්‍රමුඛතාවය ලබා දීමයි.

ග්‍රාම සංවර්ධන සැලැස්මක ප්‍රධාන අරමුණ වන්නේ ප්‍රජා සහ බාහිර මට්ටමේ ක්‍රියාකාරකම් හඳුනාගැනීම හා හඳුනාගත් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම මෙන්ම බොහෝ දුරට ඔවුන්ගේ සම්මත සමාජ ආර්ථික යහපැවැත්ම සඳහා අනාගත දැක්මක් සහ මාර්ග සිතියමක් සංවරධනය කිරීම ප්‍රජාවගේ සමෘද්ධිය තුළින් තෘප්තිමත් පුරවැසියෙක් බිහි කිරීමයි. VDP කාරයක්ෂමව ලබා ගැනීමේදී ප්‍රජා ආයතනවල ප්‍රධාන භූමිකාව මෙන්ම ගෘහ අසල්වැසි සහ ගම් මට්ටමින් සංවර්ධන සේවා සපයන රාජ්‍ය හා පෞද්ගලික ආයතන, පළාත් පාලන ආයතන, පරිත්‍යාගශීලීන් සහ උපදේශකයින් සේවා ලබාගැනීම ඉතා වැදගත් වන අතර සහ හඳුනාගත් සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය නොවන සංවිධාන වල බාහිර සහයෝගය ඉතා වැදගත් වේ.

## 1.3 ග්‍රාම සංවර්ධන සැලැස්මේ මාර්ගෝපදේශය සැකසීමේ ක්‍රියාවලිය

| මාර්ගෝපදේශ මූලධර්ම | ඇතුළත් ක්‍රියාකාරකම් |
|---|---|
| සහභාගිත්වය | • වසම් මට්ටමින් පුළුල් ප්‍රජා පාදක රැස්වීම්<br>• වසම තුළ සියලුම ප්‍රජා අංශවල සහ ප්‍රජා නියෝජිතයින් ඇතුළත් වේ.<br>• ග්‍රාම සංවර්ධන සැලැස්මට ඉඩම් නොමැති සහ වසමේ අඩු ආදායම් ලාභීන් ඇතුළත් වීම.<br>• කාන්තාවන් සහ තරුණයින් ඇතුළු සියලු ප්‍රජා අංශය සහභාගි වීම. |
| ඒකාබද්ධ ප්‍රවේශය | • ඒකාබද්ධ සංවර්ධනයේ සියලු අංශ පිළිබඳ තොරතුරු රැස්කිරීම.<br>• ප්‍රමාණාත්මකතාව අනුව විවිධ ඉඩම් පරිහරණ, යටිතල පහසුකම් සහ මහජනතාව සඳහා මැදිහත් වීම් හඳුනාගැනීම.<br>• පහසුකම්,දරිද්‍රතාවය අවම කිරීම සහ ජීවනෝපාය වැඩි දියුණු කිරීම.<br>• ප්‍රජා ආයතනවල සහ ප්‍රතිලාභීන්ගේ වගකීම හඳුනාගැනීම. |
| වගකීම සහ විනිවිදභාවය | • ප්‍රජාවේ සමස්ත සැලසුම් ක්‍රියාවලිය ම සහභාගි වීය.<br>• සැලැස්ම තුළ වගකීම පැහැදිලිව හඳුනාගෙන ඇත. (උදාහරණ - ප්‍රජාව, සේවාව සපයන්නන්)<br>• සැලසුම් ලේඛනය වසමේ ප්‍රජාවගේ දේපල වන අතර එය සියල්ලන්ටම ප්‍රවේශ විය හැකිය.<br>• ප්‍රජා සාමාජිකයින්/ ප්‍රතිලාභීන් මැදිහත්වීම් ස්ථාන විවෘතව හඳුනාගනී.<br>• ප්‍රජා රැස්වීම් තුළින් වරින්වර සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කළ යුතුය. |

## 2. වන කොටස


### 2.1 වසම හැඳින්වීම හා පිහිටීම

"හත්බෝධිය" යන නාමය මෙම වසමට භාවිතා කිරීම සම්බන්ධයෙන් මුඛ වහරේ මෙලෙසින් පැවත ගෙන එනු ලබයි. එනම් කෝට්ටේ යුගයට පෙර ඉන්දියාවෙන් පැමිණි බ්‍රාහ්මණයන් පිරිසක් කතරගම බලා යන ගමනේදී නවාතැන්පළක් වශයෙන් මෙම ස්ථානය තෝරාගෙන දින හතක් එහි නැවතී සිට ඇත. එම කාලය තුළ දී ඔවුහු බෝගස් හතක් එම ස්ථානයේ රෝපණය කර, කාලි මෑණියන් වෙනුවෙන් පුද පූජා පවත්වා ඇත. එම බෝගස් හතම කළු පැහැයෙන් යුක්ත වී ඇත. පසුකාලීනව මෙම බෝධීන් වහන්සේලා හත්නම රෝපණය කර තිබූ ස්ථානය නිසා මෙම ස්ථානය "හත්බෝධිය" නමින් ප්‍රසිද්ධ විය.

කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වසම් පහළවක් අතරින් හත්බෝධිය වසම දකුණේ විලවල ග්‍රාම නිලධාරී වසම සහ සරණංකර වසමේ කොටසකුත් නැගෙනහිරෙන් විලවල ග්‍රාම නිලධාරී වසමේ කොටසක් සහ කළුබෝවිල ග්‍රාම නිලධාරී වසමත්, දකුණින් බොල්ගොඩ ඇළ සහ ගල් වල ග්‍රාම නිලධාරී වසමත්, බටහිරෙන් සරණංකර ග්‍රාම නිලධාරී වසම සහ ගල්වල ග්‍රාම නිලධාරී වසමටත් මායිම්ව හෙක්ටයාර් 43.75 පුරා විහිදී ඇත.

### 2.2 සිතියම හා මාර්ග ලේඛනය

| වීදියේ නම | වීදි අංකය |
|---|---|
| ඇලකණ්ඩිය පාර | ඔත්තේ අංක 1 සිට 97 දක්වා |
| ශ්‍රී විමලසිරි පාර (කළුබෝවිල පාර) | ඉරට්ටේ අංක 124 සිට 186 දක්වා |
| කැරන් පෙදෙස | සියළුම අංක |
| කොටගම වාචිස්සර මාවත | ඔත්තේ අංක 111 සිට 223/A දක්වා ඉරට්ටේ අංක 22 සිට 122 |
| කොටගම වාචිස්සර මාවත(කළුබෝවිල පාර) | ඔත්තේ අංක 65 සිට 185 දක්වා සහ A/1/5 සිට C/4/4 දක්වා |
| ආසිරි මාවත(3 වන ඇල පාර) | සියළුම අංක |
| ද අල්විස් මාවත | සියළුම අංක |
| ද සිල්වා පාර | ඉරට්ටේ අංක 40 සිට 66/3 දක්වා |
| පී.රුබන් පීරිස් මාවත(2 වන ඇල පාර) | සියළුම අංක |
| ප්‍රතිබිම්බාරාම පාර | ඉරට්ටේ අංක 2 සිට 50 දක්වා |
| පාසල් මාවත | සියළුම ඔත්තේ අංක හා ඉරට්ටේ අංක 2 සිට 20 දක්වා |
| ශ්‍රී මහ විහාර මාවත | ඔත්තේ අංක 159 සිට 207 දක්වා |
| ශ්‍රී සරණංකර පාර | ඔත්තේ අංක 159 සිට 207 දක්වා |
| හත්බෝධිය පාර | ඔත්තේ අංක 45 සිට 87 දක්වා |
| | ඉරට්ටේ අංක 2 සිට 72 දක්වා |
| විජයබා මාවත(4 වන ඇල පාර) | සියළුම අංක |




## 2.3 සමාජයීය හා සංස්කෘතික කරුණු

හත්බෝධිය වසම තුළ විවිධ ජාතීන් සහ විවිධ ආගමිකයන් නියෝජනය වන සහජීවනයෙන් වෙසෙන ජන කොට්ඨාසයක් දැකිය හැකිය. හත්බෝධිය වසම තුළ රාජ්‍ය ආයතන ලෙස බුද්ධඝෝෂ විදුහල, අධ්‍යපාන අමාත්‍යාංශයට අනුබද්ධ ව ඇති ගුරු පුහුණු මධ්‍යස්ථානය, මහජන බැංකුව, සණස සංවර්ධන බැංකුව, ග්‍රාමීය බැංකුව, සමුපකාරය ආදිය පිහිටා ඇත. විහාරස්ථානයක්, පොදු පරිහරණය සඳහා නාන ළිං දෙකක් මෙන්ම ප්‍රජා ශාලාවකින් ද වසම පොහොසත් වේ. මාර්ග පද්ධතීන් වසම පුරාම විහිදී යන අතර රෝහල පාර ශ්‍රී සරණංකර පාර ප්‍රධාන මාර්ග වේ. බහුල වශයෙන් මාර්ග කාපට් කර ඇති අතර සුළු ප්‍රමාණයක් තාර දමා සංවර්ධනය කර හා කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කර ඇත.

විවිධ වූ ජීවනෝපාය ක්‍රම යටතේ තම ජීවිතය පවත්වාගෙන යන බහුවිධ පිරිසක් ජීවත්වන හත්බෝධිය වසම තුළ බහුතරයක් තම ශ්‍රමය කැපකර ආදායම් උත්පාදන මාර්ග වල නිරත වී ඇත. අනෙකුත් පිරිස වෘත්තීමය හා මානසික ශ්‍රමය වැය කර ආදායම් උපයා ගනු ලබයි.


## 2.4 මූලික තොරතුරු

| | |
|---|---|
| ජනගහනය | 6781 |
| මුළු භූමි ප්‍රමාණය වර්ග කි.මී. | 0.43 |
| ජනවර්ගයන් අනුව ජනගහනය | සිංහල - 3892 |
| | මුස්ලිම් - 2468 |
| | දමිළ - 198 |
| | වෙනත් - 223 |

## 2.5 සංස්කෘතික හා සමාජයීය වශයෙන් වැදගත් ස්ථාන

***හත්බෝධිය රජමහ විහාරය***

ගම්පොළ රාජ්‍ය සමයට අයත් සේ සැලකෙන මෙම විහාරස්ථානය කෝට්ටේ රාජ්‍ය සමයේ දී ඉතා දියුණුව පැවත ඇත. ඕලන්ද යුගයේ දී විනාශ මුඛයට පත්ව අභාවයට ගොස් තිබිණි. ඉතා පැරණි බෝධින් වහන්සේලා සත් නමක් වැඩ සිටින නිසා හත්බෝධිය රජමහ විහාරය නම් වී ඇත. පැරණි දේවලින් දැනට ඉතිරිව ඇත්තේ අකුරු කියවිය නොහැකි සෙල්ලිපියක් හා නටබුන්ව ඇති විෂ්ණු කතරගම දේවාල දෙක සහ කාලි කෝවිලයි.





## 3. යටිතල පහසුකම් සංවර්ධනය

රටක සංවර්ධනය උදෙසා ප්‍රාදේශීය සංවර්ධනය අතිශයින් වැදගත් වේ. ප්‍රාදේශීය සංවර්ධනයේ දී ප්‍රමුඛත්වය ගන්නේ ග්‍රාමීය සංවර්ධනයයි. ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට සහ රටෙහි සංවර්ධනයට ඍජු දායකත්වයක් ලබා ගැනීමට යටිතල පහසුකම් සංවර්ධනය විශාල දායකත්වයක් ලබාදේ. යටිතල පහසුකම් සංවර්ධනයෙහි ලා මාර්ග, කානු, පාලම්, නිවාස, විදුලිය, සනීපාරක්ෂක පහසුකම් මූලික වේ.

### 3.1 මාර්ග, පාලම් හා කාණු පද්ධතිය අළුත්වැඩියාව

හත්බෝධිය වසම තුළ මාර්ග පාලම් හා කාණු පද්ධතිය අලුත්වැඩියාව හා ප්‍රතිසංස්කරණය කළ යුතුව ඇත. මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය තුළින් වසමේ සියලු දෙනාටම සුව පහසුවෙන් ඉක්මනින් හා ආරක්ෂාකාරීව තම ප්‍රවාහන අවශ්‍යතාවය සලසා ගැනීමට හැකිය.

| | |
|---|---|
| ගැටලුව | • මාර්ග අබලන් වීම නිසා එදිනෙදා කාර්යයන් සඳහා වැය වන කාලය අධික වීම.<br>• අතුරු මාර්ග වල ඇති අඩු ඉඩකඩ නිසා මාර්ග තදබදය ඇතිවීම.<br>• වර්ෂා කාලවලදී කාණු අවහිර වීම නිසා ගංවතුර තත්ත්වයක් ඇතිවීම නිසා මාර්ග අවහිර වීම සහ නිවාස වලට හානි වීම. |
| අරමුණ | උසස් ප්‍රමිතියෙන් යුත් දිගු කාලීන පැවැත්මක් සහිත මාර්ග පද්ධතියක් සැකසීම හා වර්ෂා කාලවලදී ජලය විධිමත් ව බැස යාමට සුදුසු ක්‍රමවේදයක් සකස් කොට කානු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම |
| උපාය මාර්ගය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරී, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ප්‍රධාන නාගරික ඉංජිනේරු, තාක්ෂණ නිලධාරීන්, පළාත්බද මාරග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරී මගින් අබලන් මාරග හා කාණු පද්ධතියෙන් පරීක්ෂා කොට ගැලපෙන ක්‍රමවේදයක් යටතේ දිගුකාලීන පැවැත්මක් තහවුරු වන පරිදි මාර්ග කාණු සංවර්ධනයට සැලැස්මක් ගොඩනැගීම. |

**3.2 භෞතික යටිතල පහසුකම් වලට අදාළ සංවර්ධන යෝජනා**

| පහසුකම් වර්ගය | මාර්ගයේ නම | දිග සහ පළල | ප්‍රතිලාභීන් ගණන | වගකීම |
|---|---|---|---|---|
| මාර්ග පද්ධතිය | රෝහල පාරේ නිවාස අංක 167/20 A සිට නිවාස අංක 167/18 A දක්වා ඇති අතුරු මාර්ගය සංවර්ධනය කිරිම | දිග - 132m<br>පළල - 3.7 m<br>(12'-0") | පවුල් 25 | දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | රෝහල පාරේ ජපන් ලංකා ඔටෝලැන්ඩ් පුද්ගලික සමාගම අසල සිට (අංක 149) අංක 153/16 දරණ නිවාස අංක දක්වා අතුරු මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිම. | දිග - 120m<br>පළල - 4.9m<br>(16'-0") | පවුල් 50 | දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | හත්බෝධිය පාර නිවාස අංක 39/1/1 සිට නිවාස අංක 45 දක්වා අතුරු මාර්ගයේ කාණු ප්‍රතිසංස්කරණය කොට පාර කාපට් කිරීම. | දිග - 250m<br>පළල - 3.7 m<br>(12'-0") | පවුල් 20 | දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | ආසිරි පටුමග තාර දැමීම | දිග - 150m<br>පළල - 3.7 m<br>(12'-0") | පවුල් 25 | දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | විජයබා මාවත කාපට් කිරීම | දිග - 500m<br>පළල - 4.9 m<br>(16'-0") | පවුල් 50 | දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | රූබන් පීරිස් මාවත කාපට් කිරීම | දිග - 200m<br>පළල - 3.7 m<br>(12'-0") | පවුල් 30 | දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | පාසල් මාවතේ නිවාස අංක 18/A සිට නිවාස අංක 16/1 දක්වා අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | දිග - 150m<br>පළල - 3.7 m<br>(12'-0") | පවුල් 25 | දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | 55 වත්ත නිවාස යෝජනා ක්‍රමය ඇතුළත ඇති පාලමට අත් වැටක් ඉදිකිරීම | දිග - 4.6m<br>පළල - 6.9 m | පවුල් 65 | දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

## **3.3.** විශේෂ සංවර්ධන යෝජනා

- ශ්‍රී මහා විහාර පාර "නිවාස අංක 55" ඉදිරිපිට ඇති බෝක්කුව ප්‍රමාණයෙන් කුඩා වීම හේතුවෙන් වැසි දිනවලදී එම ස්ථානයේ සිට ශ්‍රී මහා විහාර පාරෙහි හාතිය මාවත ට හැරෙන ස්ථානය දක්වාත්, විලවල ග්‍රාම නිලධාරී කාර්යාලය අසල සිට වින්සර් පාර්ක් දක්වා කොටසත් ජලයෙන් යට වී පවුල් සියයකට අධික ප්‍රමාණයක් පීඩාවට පත්වෙති. මෙම ප්‍රදේශය ජලයෙන් යට වීම වැළැක්වීමට මෙම බෝක්කුව පුළුල් කොට නියමිත ප්‍රමාණයෙන් සකස් කිරීම හා ඒ හරහා දිවෙන අතුරු ඇළ මාර්ගය මුං ඇට බෝක්කුව දක්වා සුද්ධ පවිත්‍ර කොට නිසි අයුරින් ජලය බැස යාමට ක්‍රමවේද සැකසීම කළ යුතුය.

- හත්බෝධිය පාරෙහි නිවාස අංක 46/1 සිට 46/16 දක්වා නිවාස වැසි සමයේදී ජල ගැලීමෙන් පීඩාවට පත්වෙයි. මෙයට ප්‍රධාන හේතුව එම නිවාස ඉදිරිපිට ඇති කාණු පද්ධතිය කුඩා වීමයි. මෙමගින් පවුල් දහයක් පමණ පීඩාවට පත්වෙති. මෙම තත්ත්වය වළක්වා ගැනීමට නම් මෙම නිවාස ආශිත කාණු පද්ධතිය පුළුල් කොට මාරගය සංවරධනය කළ යුතුය.

- හත්බෝධිය වසමට ළමා උද්‍යානයක් නොමැත. නාගරික පරිසරයක් තුළ ජීවත්වන කුඩා දරුවන්ට තම තමන්ගේ නිවෙස් වල ක්‍රීඩා කිරීමට තරම් ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැත. ළමා උද්‍යානයක් ඉදිකිරීම මගින් එය දරුවන්ගේ ශාරීරික මෙන්ම මානසික සෞඛ්‍යයට විශාල පිටිවහලක් වේ.

- හත්බෝධිය වසමෙහි ජීවත්වන ජනතාව මුහුණ දෙන ප්‍රධානතම ගැටලුව වන්නේ ග්‍රාමසේවක කාරයාලයක් තම වසම තුළ පිහිටා නොතිබීම මෙන්ම වසමට අනුයුක්තව රාජකාරි කටයුතු කරන අනිකුත් රාජ්‍ය නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමට ද හමුවීමට ද වසමින් පිට ස්ථානවලට යාමට සිදුවීමයි. එම නිසා මෙම සියලු රාජ්‍ය නිලධාරීන්ට තම රාජකාරි කටයුතු කරගෙන යාමට වසම තුළ සේවා පියසක් වැනි පොදු ස්ථානයක් ඉදිකර දීම ඵලදායි වේ.

## 3.4. අබලන් වී ඇති මාර්ග





3.5. **නිවාස පහසුකම් සැලසීම**

| | |
|---|---|
| ගැටළුව | වසම තුල අඩු පහසුකම් සහිත නිවාස සහ නීත්‍යානුකූල හිමිකාරීත්වයක් නොමැති නිවාස පැවතීම. |
| අරමුණ | වසමේ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ අභිමානවත් ජීවිතයක් ගත කිරීමට හැකියාව උදා කරවීම. |
| උපාය මාර්ග | නිවාස සංවරධන අධිකාරියේ නිවාස නිලධාරීන් මගින් නිවාස පහසුකම් සැලසිය යුතු ප්‍රතිලාභීන් තීරණය කොට ගෙන ඊට අදාළව ගත යුතු ක්‍රියාමාරග පිළිබඳව වැඩපිළිවෙළක් සකසා ගැනීම. |
| ක්‍රියාකාරකම | • නීත්‍යානුකූලත්වය සම්බන්ධ ගැටලු පවතින ප්‍රතිලාභීන් ඉඩම් නිලධාරීන් වෙත යොමු කිරීම.<br>• අඩු පහසුකම් සහිත නිවාස සම්බන්ධයෙන් නිවාස නිලධාරීන් මගින් නිවාස ඉදිකර දීමට කටයුතු සැලසීම හෝ ද්‍රව්‍ය ආධාර ලබා දීම. |
| වගකීම | • නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස නිලධාරී<br>• ග්‍රාම නිලධාරී - ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ<br>• ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරී |

**වසමේ නිවාස පහසුකම් සලසා දිය යුතු ප්‍රතිලාභී ලේඛනය**

| නම | ලිපිනය |
|---|---|
| උඩගේ කම්කානම්ගේ ස්වර්ණලතා | නො. 30/ C, විජයබා මාවත, කළුබෝවිල, දෙහිවල. |
| සිංගකුට්ටි ආරච්චිගේ සුදර්මා කුමාරිහාමි | නො. 15/16, රුබන් පිරිස් මාවත, කළුබෝවිල, දෙහිවල. |
| උඩගේ කම්කානම්ගේ රෝෂිණී ප්‍රියංගිකා | නො.153/4, රෝහල පාර, කළුබෝවිල, දෙහිවල. |
| සුදුවැලි කොන්දගේ ප්‍රේමසිරි | නො.11/2, ආසිරි මාවත, කළුබෝවිල, දෙහිවල. |
| ආර්.පද්මිණී | නො.187/19 A, ජයසමඟි මාවත, කළුබෝවිල, දෙහිවල. |





## 3.6. විදුලි පහසුකම් සැලසීම

| | |
|---|---|
| ගැටළුව | විදුලිය නොමැති වීම නිසා තම දෛනික ජීවිතයේ කාර්යයන් ඉටුකර ගැනීමේදී දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දීම. |
| අරමුණ | වසමේ විදුලිය නොමැති ජනයාට විදුලි පහසුකම් සලසා දී ඔවුන්ගේ ආර්ථික, සමාජයීය, මානසික මට්ටම නංවාලීම. |
| උපාය මාර්ග | විදුලිබල මණ්ඩලය මගින් විදුලිය ලබාදීමට සුදුසුකම් සපුරන්නේද සොයා බලා ඒ සඳහා අවශ්‍ය ඉදිරි වැඩ පිළිවෙලවල් සකස් කිරීම. |
| ක්‍රියාකාරකම | විදුලිබල මණ්ඩලය හරහා විදුලිය ලබාදීමේ ක්‍රමවේදයන්ට යටත්ව සහනදායි ක්‍රමයට විදුලිය ලබාදීමට කටයුතු කිරීම. |
| වගකීම | • ලංකා විදුලිබල මණ්ඩලය<br>• ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| ප්‍රතිලාභීන් | විදුලිය නොමැති ප්‍රතිලාභීන් |

**වසමේ විදුලි පහසුකම් සලසා දිය යුතු ප්‍රතිලාභී ලේඛනය**

| නම | ලිපිනය |
|---|---|
| දේවාලගෙදර ඉනෝකා ප්‍රියදර්ශනී | නො.33/1, ජයසෙවන මාවත, කළුබෝවිල, දෙහිවල. |





## 3.7. සනීපාරක්ෂක පහසුකම් සැලසීම

විශේෂයෙන් වසම තුළ ජීවත්වන අඩු ආදායම්ලාභී නිවාස සඳහා ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් නොමැත. කුඩා ඉඩ ප්‍රමාණයක ජීවත් වන මොවුන් විසින් අවම සෞඛ්‍ය පුරුදු සහිත ජීවන රටාවක් පවත්වාගෙන යනු ලබයි.

| | |
|---|---|
| ගැටලුව | • අඩු පහසුකම් සහිත සනීපාරක්ෂක පහසුකම් පැවතීම.<br>• වැසිකිලි වලවල් උතුරා යෑම. |
| අරමුණ | විධිමත් සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම මගින් ජනයාගේ සෞඛ්‍ය තත්ත්වය උසස් කිරීම පාරිසරික සිදුවන හානි අවම කිරීම. |
| උපාය මාර්ග | විධිමත් සනීපාරක්ෂක පහසුකම් නොමැතිව වසම තුළ ජීවත් වන මහජන සෞඛ්‍ය පරික්ෂක නිලධාරීන්ගේ නිර්දේශය හා උපදෙස් අනුව තාක්ෂණ නිලධාරීන් මගින් සනීපාරක්ෂක පහසුකම් සලසා දීමට සැලසුම් සකස් කිරීම. |
| ක්‍රියාකාරකම | • වසමේ අඩු පහසුකම් සහිත වැසිකිලි ඇති ප්‍රතිලාභීන් සඳහා මූල්‍යාධාර හෝ ද්‍රව්‍ය ආධාර ලබා දීම.<br>• භාවිතයට නුසුදුසු වැසිකිලි ඇති ප්‍රතිලාභීන්ට මූල්‍ය ආධාර හෝ ද්‍රව්‍ය ආධාර ලබා දීම. |
| වගකීම | • ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරී<br>• සමෘද්ධි සංවර්ධන නිලධාරි<br>• සමාජ සේවා නිලධාරී - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• මහජනසෞඛ්‍ය පරික්ෂක - දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව<br>• ග්‍රාම සේවා නිලධාරීන් |

- වසම තුළ අඩු පහසුකම් සහිත වැසිකිලි පවතින නාමලේඛනය

| | ප්‍රතිලාභියාගේ නම | ලිපිනය |
|---|---|---|
| 01. | ඉන්ද්‍රනි සෙබස්තියන් | නො. 187/66 ,ජයසමගි මාවත, කළුබෝවිල, දෙහිවල. |
| 02. | සිංගකුට්ටිආරච්චිගේ සුධර්මා කුමාරිහාමි | නො.15/16, රුබන් පිරිස් මාවත, කළුබෝවිල, දෙහිවල. |
| 03. | ප්‍රියංගා දිල්හානි | නො.187/17, ජයසමගි මාවත, කළුබෝවිල, දෙහිවල. |

## 4. නිපුණතා සංවර්ධන හා හැකියා වර්ධන සැලැස්ම

රටේ අනාගත පරපුර ඵලදායි පුරවැසියන් බවට පත් කිරීමට නම් ඔවුන් නව දැනුමින් පෝෂණය කිරීම ඔවුන්ගේ කුසලතා ඔප් නැංවීම හා නිපුණතා සංවර්ධනය කිරීම අනිවාර්යයෙන්ම කළ යුතු වේ.

### 4.1. නිපුණතා සංවර්ධන හා හැකියා වර්ධන සැලැස්ම

| | |
|---|---|
| ගැටලුව | • පාසල් අධ්‍යාපනය මගහැරුණු හා අඩු අධ්‍යාපන මට්ටමක් සහිත පුද්ගලයන්ගේ වෘත්තීය කුසලතාවය අවම වීම.<br>• තරුණ පිරිසගේ නියාය හා ප්‍රායෝගික පුහුණුව අවම මට්ටමක පැවතීම. |
| අරමුණ | • විධිමත් පාසල් අධ්‍යාපනයක් නොලද දරුවන් වෘත්තීය පුහුණුවට නැඹුරු කිරීම.<br>• තරුණ පිරිසගේ වෘත්තිය නිපුණතාවය ඉහළ නැංවීම.<br>• නිපුණතා සංවර්ධනය ඉහළ නැංවීම මගින් නව රැකියා අවස්ථා උත්පාදනය. |
| උපාය මාර්ග | • වෘත්තීය පුහුණුව නොමැති පිරිස වෘත්තීය පුහුණුවට යොමු කිරීම.<br>• වර්තමානයට ගැළපෙන පරිදි වෘත්තිය දැනුමක් සහ පුහුණුව යාවත්කාලීන කිරීම. |
| ක්‍රියාකාරකම | • ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඇති වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන වලට තරුණ තරුණියන් යොමු කිරීම.<br>• වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම. |
| වගකීම | • නිපුණතා සංවර්ධන නිලධාරි - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• මානව සම්පත් සංවර්ධන නිලධාරී - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• විද්‍යා හා තාක්ෂණ නිලධාරී - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• සංවර්ධන නිලධාරි - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

- **පහත සඳහන් වෘත්තීය පාඨමාලා උදාහරණ ලෙස දැක්විය හැක.**

| | පාඨමාලාව | ස්ථානය | කාලය |
|---|---|---|---|
| 01. | රූපලාවන්‍ය ශිල්පය හා කොණ්ඩා සැකසුම් ශිල්පය | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, පල්ලිය දොර පාර, කවුඩාන, දෙහිවල | පූර්ණකාලීන අර්ධකාලීන |
| 02. | Mobile phone repair technician- MPR | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, පල්ලිය දොර පාර, කවුඩාන, දෙහිවල | අර්ධකාලීන |
| 03. | Motorcycle technician – MBC | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, පල්ලිය දොර පාර, කවුඩාන, දෙහිවල | අර්ධකාලීන |

## 5. සමාජ සංවර්ධන සැලැස්ම

රටක සංවර්ධනයෙහි වැඩිදියුණුවට බලපාන වැදගත්ම සාධකයක් වන්නේ සමාජ සංවර්ධනයයි. සමාජ සංවර්ධනයෙහිලා අධ්‍යාපනය, සෞඛ්‍යය හා පෝෂණය ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු වැඩිහිටි ප්‍රජාවගේ සුභසිද්ධිය මූලික වේ. රටක සැබෑ සංවර්ධනය ඇති වන්නේ ආර්ථික, භෞතික සමග ආධ්‍යාත්මික සංවර්ධනය ද ඇති වන විටය. ආර්ථික වර්ධනයේ යහපත භෞතික සංවර්ධනයයි. එමගින් පුද්ගලයාගේ සමාජයේ හෝ රටේ ඇසිදිසි දියුණුව පෙන්නුම් කරයි. සමාජය හෝ රටේ දියුණුව පෙන්නුම් කරයි.

| | |
|---|---|
| ගැටලුව | • වැඩිහිටි ප්‍රජාව සමාජයෙන් හුදෙකලා වීමෙන් පීඩාවට පත්වීම.<br>• කායික රෝග මෙන්ම මානසික ආතතියෙන් පෙලෙන පිරිසක් බවට පත්වීම.<br>• ඔවුන්ව රැකබලා ගැනීමට කිසිවෙක් නොමැති වීම නිසා සමාජයේ හුදෙකලා වීම. |
| අරමුණ | • වැඩිහිටි ප්‍රජාව සමාජයේ සක්‍රිය ක්‍රියාකාරී පිරිසක් බවට පත් කිරීම.<br>• ඔවුනට මානසික හා ශාරීරික සුවතාවය ලබාදීම. |
| උපාය මාර්ග | වැඩිහිටි ප්‍රජාව සවිබල කර සමාජ ක්‍රියාකාරකම් වලට දායක කරවා ගැනීම මගින් ඔවුන්ට කායික හා මානසික සුවය සැලසීම. |
| ක්‍රියාකාරකම | • වසම තුළ පවතින සක්‍රිය වැඩිහිටි සමිති මගින් වැඩිහිටියන්ව විනෝද චාරිකා , වන්දනා ගමන් සඳහා සහභාගි කරවා ගැනීම.<br>• විවිධ විනෝදාත්මක වැඩසටහන් පවත්වා ඔවුන්ට මානසික සුවය සැලසීම.<br>• වැඩිහිටි විවිධ ප්‍රසංග, සුහද හමු ආදිය මඟින් ඔවුන්ගේ ඒකාකාරී ජීවන රටාවෙන් ඔවුන්ව මුදවාගැනීම |
| වගකීම | • සමාජ සේවා නිලධාරී - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• ග්‍රාම නිලධාරී - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• සංවර්ධන නිලධාරීන් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| ප්‍රතිලාභී | 1490 |

## 5.1 අධ්‍යාපනය

රටේ අනාගත පරපුර ඵලදායි පුරවැසියන් බවට පත් කිරීමට නම් ඔවුන් නව දැනුමින් පෝෂණය කිරීම ඔවුන්ගේ කුසලතා ඔප් නැංවීම සහ නිපුණතා සංවර්ධනය කිරීම අනිවාර්යවේ. දරුවන් පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා ම දහම් අධ්‍යාපනයට නැඹුරු කරවීම ද දෙමව්පියන් ගේ වගකීම සහ යුතුකම යි.

## 5.2 පාසල්

| | |
|---|---|
| ගැටලුව | • ප්‍රදේශයේ පිහිටා ඇති පාසලෙහි පවතින ක්‍රිඩා පහසුකම්, ගොඩනැගිලි, ගුරුවරු හා පාසැල් වෙත ළමුන් යොමු කර ගැනීම සම්බන්ධයෙන් පවතින දුෂ්කරතා.<br>• පහල අධ්‍යාපන මට්ටම් සහිත දෙමව්පියන් දරුවන් පාසලට යොමු කිරීමට දක්වන උනන්දුව අවම වීම.<br>• ආර්ථික සමාජයීය ගැටලු |
| අරමුණ | • පාසල සංවර්ධනය කිරීම තුලින් වසම තුළ සිටින දරුවන් සඳහා විධිමත් අධ්‍යාපන ක්‍රමයක් සකස් කර ගැනීම.<br>• රටේ අනාගත පරපුර සමාජීය හා අධ්‍යාපනික මට්ටමින් ඉහළ තලයකට ගෙන ඒම.<br>• නිවැරදි දැක්මක් ඇති දරු පරපුරක් බිහි කිරීම. |
| උපාය මාර්ග | පාසල් අධ්‍යාපනයෙහි වැදගත්කම අවබෝධ කර දීමෙන් දරුවන් පාසලට යොමු කරවීමට සැලසුම් සකස් කිරීම. |
| ක්‍රියාමාර්ග | • ළමා හිමිකම් සංවර්ධන නිලධාරි මගින් පාසල් යන වයසේ පසු වන පාසල් නොයන දරුවන් පාසල් අධ්‍යාපනයට යොමු කිරීම.<br>• විවිධ වැඩසටහන් මගින් දරුවන්ට සහ දෙමාපියන්ට පාසල් අධ්‍යාපනයෙහි වැදගත්කම අවබෝධ කර දීම. |
| වගකීම | • ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ළමා හිමිකම් සංවර්ධන නිලධාරි<br>• කලාප අධ්‍යාපන කාර්යාලය<br>• අධ්‍යාපන අමාත්‍යාංශය<br>• ග්‍රාම නිලධාරී<br>• ග්‍රාම සංවර්ධන නිලධාරී |
| ප්‍රතිලාභීන් | 1855 යි |

## 5.3 දහම් පාසල් අධ්‍යාපනය

| | |
|---|---|
| ගැටලුව | දරුවන් දහම් පාසල් අධ්‍යාපනයට යොමුවීමේ අඩු ප්‍රවණතාවක් පැවතීම නිසා සාරධර්ම පිරිහුණු අනාගත පරපුරක් ගොඩනැගීම. |
| අරමුණ | දහම් අධ්‍යාපනය මගින් විනයගරුක සහ සාරධර්ම වලින් සුපෝෂිත අනාගත පරපුරක් ගොඩනැගීම. |
| ක්‍රියාකාරකම් | • වසමේ දහම් පාසලේ පවතින භෞතික හා මානව සම්පත් සංවර්ධනය කිරීම.<br>උදාහරණ:- හත්බෝධිය රජමහා විහාරයේ පැවැත්වෙන ශ්‍රී මහා බෝධිරාජ දහම් පාසලටඩෙක්ස්, පුටු ලබාදීම.<br>• වැඩි වශයෙන් ගුරුවරුන් දහම් පාසලේ ඉගැන්වීම් කටයුතුවලට යොමු කිරීම. |
| වගකීම | • ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී<br>• විහාරාධිපති ස්වාමීන් වහන්සේ<br>• ග්‍රාම නිලධාරී |
| ප්‍රතිලාභීන් | 400 |

## 5.4. පාසල් සහ දහම් පාසල් වල සංවර්ධන අවශ්‍යතා

1). බුද්ධ ඝෝෂ විද්‍යාලයෙහි විදුහල්පති කාරයාලයේ බිමට ටයිල් ඇල්ලීම.

2).බුද්ධ ඝෝෂ විද්‍යාලයෙහි ගෘහවිද්‍යා අංශය පිහිටි ගොඩනැගිල්ල අළුත්වැඩියා කටයුතු කිරීම.

3). බුද්ධ ඝෝෂ විද්‍යාලයෙහි සෙල්ලම් මිදුලෙහි ප්‍රතිසංස්කරණ කටයුතු.

4). බුද්ධ ඝෝෂ විද්‍යාලයෙහි දැරණියගල ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම.

5).හත්බෝධිය රජමහා විහාරයේ ශ්‍රී බෝධිරාජ දහම් පාසලට ප්ලාස්ටික් පුටු 150 ක් ලබාදීම.

## 5.5 සෞඛ්‍යය

| | |
|---|---|
| ගැටළුව | • පාසල් දරුවන්ගේ පෝෂණය සම්බන්ධ පවතින ගැටලු (අවුරුදු 1-5 ත් අතර)<br>• පෙර පාසල් දරුවන්ගේ පෝෂණ ගැටළු<br>• ගර්භනී මව්වරුන්ගේ පෝෂණ ගැටළු<br>• අඩු බර දරුවන්ගේ ගැටළු |
| අරමුණ | වසමේ ජනතාවගේ පෝෂණ ගැටළු අවම කිරීම තුලින් නිරෝගිමත් සෞඛ්‍යය සම්පන්න ජීවන රටාවක් පවත්වාගෙන යාමට අවස්ථාව සලසා දීම. |
| ක්‍රියාකාරකම | • වසමේ පවුල් සෞඛ්‍යය සේවා නිලධාරිනිය හරහා පෙර පාසල් හා පාසල් වයසේ දරුවන්ගේ පෝෂණීය අවශ්‍යතාවයන් පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීම.<br>• අත්පත්‍රිකා, දැනුවත් කිරීම්, වැඩසටහන් මගින් සමබර ආහාර වේලක වැදගත්කම ගැන වසමේ ජනතාව දැනුවත් කිරීම.<br>• ගර්භනී මව්වරුන්ගේ සහ අඩු බර සහිත දරුවන්ගේ පෝෂණය සම්බන්ධව කරුණු පිළිබඳව මාතෘ සායන මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. |
| වගකීම | • පවුල් සෞඛ්‍යය සේවා නිලධාරී<br>• මහජන සෞඛ්‍යය පරීක්ෂක නිලධාරීන් |
| ප්‍රතිලාභීන් | • ගර්භණී මව්වරුන් (වර්ෂයෙන් වර්ෂයට සංඛ්‍යාව වෙනස් වෙයි.)<br>• අවුරුදු 1-5 ත් අතර දරුවන් |

## 5.6 ආයුර්වේද සායන

| | |
|---|---|
| ගැටළුව | දේශීය ඖෂධ ප්‍රවර්ධනය සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙළක් නොමැති වීම හා සායන පැවැත්වීම සඳහා වඩා ඵලදායි ක්‍රමවේද භාවිත නොකිරීම |
| අරමුණ | දේශීය ඖෂධ ප්‍රවර්ධනය හා දේශීය වෛද්‍ය ක්‍රම භාවිතය තුලින් රෝග නිවාරණය ප්‍රචලිත කිරීම මගින් සෞඛ්‍ය සම්පන්න නිරෝගීමත් ජීවිතයක් පවත්වාගෙන යාම. |
| ක්‍රියාකාරකම | හත්බෝධිය රජමහා විහාරයේ දැනටමත් පවත්වාගෙන යනු ලබන ආයුර්වේද සායනයට අවශ්‍ය භෞතික හා මානව සම්පත් ලබාදීම |
| ප්‍රතිලාභීන් | 6590 |

**5.7.ක්‍රීඩා පිටි හා ළමා උද්‍යානය ඉදි කිරීම**

| | |
|---|---|
| ගැටලුව | • බෝවෙන රෝග සුලබ වීම.<br>• දරුවන් ක්‍රීඩාව කෙරෙහි උනන්දුවක් නොමැති වීම. |
| අරමුණ | • වසමේ ජනයාගේ ශාරීරික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම මගින් සෞඛ්‍ය සම්පන්න නිරෝගීමත් දිවිපෙවෙතක් ගත කිරීමට මං පෙත් විවර කිරීම. |
| ක්‍රියාමාර්ග | • ක්‍රිඩා නිලධාරීන් මගින් වසමේ ජනතාව ශරීර සුවතා වැඩසටහන සඳහා සහභාගි කරවා ගැනීම.<br>• ළමා ක්‍රිඩා සමිති, තරුණ ක්‍රිඩා සමිති මගින් විවිධ ක්‍රිඩා ඉසව් සංවිධානය කර ප්‍රජාව ඒ සඳහා දායක කර ගැනීම.<br>• වසමට ක්‍රිඩාපිටියක් නැත ඉදිකිරීමට සුදුසු ඉඩමක් ද නැත.<br>• හත්බෝධිය වසමේ ළමා උද්‍යානය නොමැති නිසා ළමා උද්‍යානයක් ඉදිකිරීම. |
| වගකීම | • ප්‍රාදේශීය ලේකම් කාර්යාලේ ක්‍රිඩා නිලධාරී.<br>• දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව. |
| ප්‍රතිලාභීන් | තුන්දාස් පන්සීයයි |

## 6. ළමා අපයෝජනය

| | |
|---|---|
| ගැටලුව | වාර්තාවන, ඉලක්ක වයස් කාණ්ඩවල ළමුන්ට අමතරව නිරන්තරයෙන් අපයෝජනයට හිංසනයට ලක්වන හා ලක්විය හැකි දරුවන් ප්‍රජාව තුළ සිටීමට හේතු ලෙස දෙමව්පිය රැකවරණය අහිමි වීම, පවුල් සංස්ථාව බිඳ වැටීම්, ආර්ථික ගැටලුවලින් පීඩිත නාගරික වතු සංස්කෘතියක් තුළ දරුවන් ජීවත් වීම පෙන්වාදිය හැකිය මෙය ළමා පරපුරට මෙන්ම රටේ අනාගතය බාර ගන්නා දරුවන්ට වන විශාල හිරිහැරයක් සමස්ත රටේ සංවර්ධනයට විශාල ගැටලුවකි |
| අරමුණ | වාර්තාගත වන අපයෝජනයට ලක් වන දරුවන් එයින් මුදවා අනාගත සුරක්ෂිතතාව ඇති කිරීමත් අපයෝජනයට ලක්විය හැකි බාහිර සාධක සහිත පරිසරයක සමාජයක ජීවත් වන ළමුන් හට ඒ පිළිබඳ අවබෝධ කර දී එම දරුවන් අපයෝජනයට ලක් වීමෙන් වළක්වා ගැනීමත්ය. |
| උපාය මාර්ග | දරුවන් වෙනුවෙන් ළමා සමිති පිහිටුවා ළමා සංවර්ධනය සැලැස්මක් ප්‍රජාව තුළ ඇතිකර ප්‍රජා සංවිධාන වල නායකයින්ගෙන් දායකත්වයෙන් වැඩිහිටි ප්‍රජාව මෙන්ම පාසල් දරුවන් ද දැනුවත් කිරීමේ වැඩසටහන් වලට යොමු කර අපයෝජනයට ලක්විය හැකි අවස්ථා පිළිබඳවත් තමන් හා නිතර ගැටෙන පුද්ගලයන්ගෙන් ද එසේ විය හැකි අවදානම පිළිබඳ වත් එහි අනාගත ශෝචනීය තත්වය පිළිබඳවත් අනාගතයට එක්විය හැකිය කටුක අත්දැකීම් පිළිබඳවත් පුළුල් ලෙස දැනුවත් කිරීම හරහා ග්‍රම නිලධාරී වසම තුළ එවැනි තත්ත්වයක් ඇතිවිය හැකි පසුබිමක් පාලනය කර ගැනීමට අවැසි මාර්ගද මාර්ගෝපදේශ ලබා දී දරුවන්ට නිදහසේ ළමා ලෝකය හිංසනය කින් තොරව ගත කිරීමට අවස්ථාව ලබා දී රටේ අනාගත පරපුර ආරක්ෂා කිරීමට පියවර ගැනීම තුළින් දරුවන් හිංසනය කින් හා අපයෝජනයෙන් රැකගෙන සමාජයට දායක කිරීමට බලාපොරොත්තු වේ. |
| ක්‍රියාකාරකම | කුට්ටනයට, හිංසනයට ලක් වූ දරුවන්ගේ මානසික අවපීඩනය වළක්වා ගැනීම සඳහා මනෝ උපදේශනයට යොමු කිරීම් කරවීම හා පරිවාස හා ළමාරක්ෂණ අධිකාරියේ නිලධාරීන් වෙත යොමු කර සුදුසු පරිදි සමාජගත කිරීමට උපදෙස් ලබාදීම කළ හැකිය. වෛද්‍යවරුන් මගින් ළමා වැඩසටහන් පවත්වා උපදෙස් ලබාදීමත් පාසල් පද්ධතිය හරහා දරුවන්ට ඇති ගැටලු හඳුනා ගැනීමට සහ දරුවන්ගේ ගැටළු ප්‍රකාශ කිරීමට විෂය බාහිර ගුරුවරයකු පත්කර දරුවන්ගේ ගැටලු විසඳීම දරුවන් හුදකලාව ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම වැලැක්වීම. |

## 7. මත්ද්‍රව්‍ය උවදුර

මත්ද්‍රව්‍ය භාවිතයේ ආර්ථික පරිහානිය සමඟ බැඳුණු සමාජ පරිහානියේ ද කැඩපතකි වර්තමානයේ මත්ද්‍රව්‍ය භාවිතය විශේෂයෙන් පාසල් දරුවන් අතර පවා පැතිර යන වසංගතයක් බවට පත්ව ඇත. එහි භයානකම තත්වය වන්නේ දරුවන් පහසුවෙන් පොළඹවා ගත හැකි ආකාරයට මත්ද්‍රව්‍ය විවිධ ස්වරූපයෙන් වෙළඳපොළට පැමිණීමයි.

| | |
|---|---|
| ගැටළුව | වසම තුළ පාසල් වයසේ දරුවන් හා තරුණ පිරිස් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා නැඹුරු වීමත් දක්නට ඇත. අඩු ආදායම් මට්ටමක ජීවත් වීම සහ අවම අධ්‍යාපන මට්ටමක් පැවතීම හේතුවෙන් මෙය සමාජ ගැටළුවක් බවට පත්ව ඇත. දිගුකාලීනව මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් විසින් තරුණ පිරිස සහ පාසල් දරුවන් මේ සඳහා පොළඹවා ගැනීමේ ප්‍රවණතාවයක් දක්නට ඇත. |
| අරමුණ | තරුණ පිරිස් සහ පාසල් වයසේ පසුවන දරුවන් මත් උවදුරෙන් මුදවා ගෙන ඔවුනට සුරක්ෂිත අනාගතයක් සකසා දීම. |
| උපාය මාර්ග | විධිමත් ආයතන වෙත යොමු කිරීම. |
| ක්‍රියාකාරකම | • ස්ථාපිත කර ඇති මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු මගින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් හඳුනාගෙන ඔවුන් පුනරුත්ථාපන කටයුතු සඳහා යොමු කිරීම.<br>• පුනරුත්ථාපන ක්‍රියාවලියෙන් අනතුරුව එම පිරිස වෘත්තීය දැනුම සහිතව සමාජගත කිරීම.<br>• මත් උවදුරු වලට ගොදුරු වූවන්ගෙන් යැපෙන්නන් සඳහා ආදායම් මාර්ග හඳුන්වා දීම. |
| වගකීම | • අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පුහුණු සේවා නිලධාරී<br>• ළමා සංවර්ධන නිලධාරි<br>• මානව සම්පත් සංවර්ධන නිලධාරී<br>• සුළු ව්‍යාපාර සංවර්ධන නිලධාරි |
| ප්‍රතිලාභීන් | 50 ක් පමණ |

## 8.පරිසර කළමනාකරණ සැලැස්ම

### 8.1 කසල කළමනාකරණය

| | |
|---|---|
| ගැටලුව | • අවිධිමත් ලෙස කුණු කසල බැහැර කිරීම.<br>• නාගරික පරිසරය තුළ ජීවත් වන්නන්ගේ කසල බැහැර කිරීමට ක්‍රමවත් ස්ථානයක් නොමැති වීම.<br>• නියමිත දිනයන්ට වේලාවන්ට කසල ප්‍රවාහනය කිරීම සිදු නොවීම. |
| අරමුණ | • අපද්‍රව්‍ය හා කැලි කසල කළමනාකරණය පිරිසිදු හා සෞඛ්‍ය රක්ෂිත පරිසරයක් ගොඩනැගීම. |
| උපාය මාර්ග | • දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ අදාල නිලධාරීන් සමග කසල බැහැර කිරීමට සුදුසු ක්‍රමවේද සැකසීම.<br>• දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ පරිසර අංශය සමග සම්බන්ධ වී නිසි දිනයන්ට කසළ ප්‍රවාහනයට වැඩපිළිවෙලක් සැකසීම. |
| ක්‍රියාකාරකම | • කැලි කසල නිසි ලෙස ප්‍රමිතිගත කර බඳුන්ගත කිරීම.<br>• කැලි කසල ප්‍රවක්‍රීයකරණය සිදු කරන ආයතන හඳුන්වාදීම.<br>• කැලි කසල කළමනාකරණය සම්බන්ධයෙන් පරිසර නිලධාරී මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.<br>• "Eco Brik" නව ක්‍රමවේදයට අනුව කසල බැහැර කිරීම.<br>• කසල බැහැර කරන බඳුන් මාර්ගය තැනින් තැන ස්ථාපිත කිරීම.<br>• කසල රැගෙන යන දින සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම. |
| වගකීම | • පරිසර නිලධාරී ප්‍රදේශීය ලේකම් කාර්යාලය.<br>• දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ප්‍රජා සංවර්ධන නිලධාරී.<br>• පොලිස් පරිසර ඒකකය.<br>• මහජන සෞඛ්‍ය පරීක්ෂක |
| ප්‍රතිලාභින් | 1613 |

**8.2 ඩෙංගු මර්දනය**

| | |
|---|---|
| ගැටළුව | වසරේ යම් යම් කාලසීමාවලදී ඩෙංගු ව්‍යාප්තිය සීග්‍රයෙන් වර්ධනය වීම. |
| අරමුණ | ඩෙංගු ව්‍යාප්තිය පාලනය සහ අවම කිරීම. |
| උපාය මාර්ග | දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ අදාළ අංශ සමග සම්බන්ධ වී ඩෙංගු මර්ධනයට සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම. |
| ක්‍රියාකාරකම | • වීදි මාර්ග සම්බන්ධ කරගෙන විදී කම්ටු මාර්ගයෙන් වසමේ ප්‍රජාව දැනුවත් කිරීම.<br>• මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.<br>• වසමේ ප්‍රජාව අතර අත් පත්‍රිකා බෙදා දීම.<br>• ගෙයින් ගෙට ගොස් පරික්ෂා කිරීම, ශ්‍රමදාන, දූමායනය වැනි ක්‍රියාකාරකම් සිදු කිරීම.<br>• වසමේ කානු පද්ධතිය ශුද්ධ කොට එම අපද්‍රව්‍ය ක්‍රමවත් ලෙස බැහැර කිරීමට සැකසීම.<br>• පොදු ස්ථාන, රජයේ කාර්යාල, පෞද්ගලික ආයතන, ඉදිකිරීම් වැඩබිම් පරික්ෂා කිරීම. |
| වගකීම | • දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්.<br>• සෞඛ්‍ය අමාත්‍යාංශය.<br>• ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරී. |
| ප්‍රතිලාභීන් | 1613 |

## 8.3 ආපදා කළමනාකරණය

| | |
|---|---|
| ගැටළුව | වර්ෂා කාලවල දී වැසි ජලයෙන් නිවාස සහ මාර්ග යටවීමෙන් ප්‍රජාව ගේ එදිනෙදා කටයුතු අඩපණ වීම සහ පාරිසරික සහ සෞඛ්‍යමය ගැටලු මතුවීම. |
| අරමුණ | නිවාස සහ මාර්ග යටවීම වැලැක්වීම මගින් ප්‍රජාවට සුරක්ෂිත, සෞඛ්‍ය සම්පන්න, යහ පැවැත්මක් උදාකර දීම. |
| උපායමාර්ග | වැසි ජලය ක්‍රමවත්ව බැහැර වීමට අවශ්‍ය නිසි ක්‍රමවේද සැකසීම. |
| ක්‍රියාකාරකම | • සියලුම කාණු පද්ධති, ඇල මාර්ග සුද්දකොට වැසි ජලය ක්‍රමවත් ලෙස ගලා යාමට මාර්ගය සකසා දීම.<br>• බොක්කු පුළුල් කොට වැසි ජලය පිටාර මට්ටමින් තොරව ගලා යාමට සුදුසු ලෙස සැකසීම.<br>• ඇලමාර්ග අපවිත්‍ර කිරීම සම්බන්ධව වසමේ ජනයා දැනුවත් කිරීම. |
| වගකීම | • ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ ආපදා සහන සේවා නිලධාරී.<br>• දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව.<br>• ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරී.<br>• ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරී |

8.4 වසමේ වැසි ජලයෙන් යටවෙන ස්ථාන

| අනු අංකය | ස්ථානය | පීඩාවට පත්වන පවුල් ගණන |
|---|---|---|
| 01 | ද සිල්වා පාරේ නො. 40 සිට ජය සමගි මාවතේ අංක 187/17 දක්වා කොටස | 15 |
| 02 | විජයබා මාවතේ අංක 30 c සිට අංක 34 /2 දක්වා කොටස | 10 |
| 03 | ආසිරි පටුමගේ අංක 58 සිට අංක 97/1 දක්වා කොටස | 15 |
| 04 | ශ්‍රී මහා විහාර පාරේ "නිවාස අංක 55" ඉදිරිපිට ඇති බෝක්කුව අසල සිට හාතිය මාවත දක්වා ඇති කොටසත් විලවල ග්‍රාම නිලධාරි කාර්යාලය අසල සිට වීනස් පාර්ක් දක්වා කොටසත් | 100 |
| 05 | හත්බෝධිය පාරේ නිවාස අංක 46/1 සිට 46/16 දක්වා කොටස | 25 |

## 9. ග්‍රාම සංවර්ධන සැලැස්ම

**හත්බෝධිය වසම**

**ග්‍රාම සංවර්ධන ක්‍රියාකාරී සැලැස්ම**

වසම තුල හඳුනාගත් අවශ්‍යතාවයන් ප්‍රමුඛතා ගත කොට ව්‍යුහයාත්මක හා ව්‍යුහයාත්මක නොවන සංවර්ධන අවශ්‍යතාවයන් ට අනුකූලව හත්බෝධිය වසම සඳහා ක්‍රියාකාරී සැලැස්ම පහත පරිදි දැක්විය හැකිය. මෙහිදී මාර්ගෝපදේශක ක්‍රියාත්මක කිරීමේදී

1. ප්‍රජා සහභාගිත්ව පාරිසරික සාධක ඒකාබද්ධ සමානාත්මතා සංවර්ධන ක්‍රියාවලිය
2. දේශීය සම්පත් ගවේෂණය කිරීම හා භාවිතා කිරීම.
3. ස්ත්‍රී පුරුශ සමානාත්මතාව හා ප්‍රධාන ධාරාව
4. ආපදා අවදානම අවම කිරීම
5. රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය ප්‍රවර්ධනය කිරීම, කෙරෙහි මූලික අවධානය යොමු කර ඇත.

- මෙහිදී සැලසුම් කරන ලද ව්‍යුහයාත්මක හා ව්‍යුහයාත්මක නොවන ක්‍රියාවන් ස්වයං මූලධර්ම උපරිම ලෙස භාවිතයට ගනිමින් සාර්ථකව ක්‍රියාත්මක කිරීම අතිශයින් වැදගත් වේ.
- අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික සම්පත් සාර්ථක ලෙස බලමුලු ගැන්වීම හා උත්පාදනය කිරීම.
- අදාල දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ඇති රාජ්‍ය නොවන සංවිධාන, පරිත්‍යාගශීලීන් සම්බන්ධ කර ගැනීම.
- දැනටමත් පිහිටුවා ඇති බිම් මට්ටමේ ප්‍රජා ආයතන සහය හා මග පෙන්වීම ලබා ගැනීම.
- මූල්‍ය හා තාක්ෂණික සම්පත් උපරිම ලෙස භාවිතයට ගැනීමේ ක්‍රමවේදයන් ඒකාබද්ධව සකස් කිරීම.
- මෙහිදී ප්‍රාදේශීය වශයෙන් ලබාගත හැකි ප්‍රජා නායකයින් ගේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය අවශ්‍ය වේ.

## 10. ව්‍යුහයාත්මක ක්‍රියා

| අනු අංකය | ක්‍රියාකාරකම | ප්‍රජා ක්‍රියාකාරීත්වය | බාහිර වගකීම | කාල පරාසය |
|---|---|---|---|---|
| 01. | මාර්ග සහ කාණු පද්ධති සංවර්ධනය කිරීම | ස්වේච්ඡා ශ්‍රමය සම්පත් දායකත්වය | වාර්ෂික දිස්ත්‍රික් සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරීම | අවුරුදු 01 |
| 02. | අධ්‍යාපනය සඳහා වැඩි අවස්ථාවක් විවර කිරීමක් හා වෘත්තීය පුහුණු අවස්ථා ඇති කිරීම | ස්වේච්ඡා ශ්‍රමය සම්පත් දායකත්වය | අධ්‍යාපන අමාත්‍යාංශය හා වෘත්තිය පුහුණු ආයතන හා වාර්ෂික දිස්ත්‍රික් සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරීම | අවුරුදු 02 |

## 10.1 ව්‍යුහයාත්මක නොවන ක්‍රියා

| අනු අංකය | ක්‍රියාකාරකම | ප්‍රජා ක්‍රියාකාරීත්වය | බාහිර වගකීම | කාල පරාසය |
|---|---|---|---|---|
| 01 | මහජන සෞඛ්‍යය කළමනාකරණය | ප්‍රතිලාභීන් හඳුනාගැනීම හා සම්පත් දායකත්වය | සෞඛ්‍යය අංශ සමඟ සම්බන්ධ වී අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගැනීම | අවුරුදු 02 |
| 02 | ජීවනෝපාය වැඩි දියුණු කිරීම සහ ආදායම් උත්පාදනය කිරීමේ කුසලතා | ප්‍රතිලාභීන් හඳුනාගැනීම හා සම්පත් දායකත්වයන් | අධ්‍යාපන අමාත්‍යාංශය හා වෘත්තීය පුහුණු ආයතන | අවුරුදු 02 |
| 03 | මත්ද්‍රව්‍ය නිවාරණ හා පුනරුත්ථාපන ක්‍රියාවලිය | ප්‍රතිලාභීන් හඳුනාගැනීම හා සම්පත් දායකත්වයන් | ආරක්ෂක අංශ හා ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය | අවුරුදු 03 |